**පූරා විද්‍යාව**

# මඩෙහි ගිලුණු මළ සිරුරු

දිනය 1984 වර්ෂයේ අගෝස්තු මස පළමුවනදායි. ග්‍රීෂ්ම ඍතුව ගෙවෙමින් තිබිණ. වෙනද මෙන්ම සුපුරුදු ලෙස ගිම්හානයේ හිරු රැස් එංගලන්තයේ චෙෂයර් ප්‍රාන්තය හරහා වැටිනි. බොහෝ දෙනෙකු සුපුරුදු ලෙස තම කඩිනම් දිවිය අරඹමින් නගරයේ ඒ මේ අත සැරිසරනු දකින්නට තිබිණි. මේ අතර චෙෂයර් ප්‍රාන්තයේ පිහිටා ඇති විශාලතම වගුරු බිම වූ අක්කර 600 ක බිමක ව්‍යාප්තව ඇති ලින්ඩෝව් හි කඩිසරව වැඩෙහි යෙදෙන මිනිසුන් කාණ්ඩයක් සුපුරුදු ලෙස සිය කටයුතුවල යුහුසුළුව සිටියහ. ඔවුහු කිසියම් අවශ්‍යතාවක් සඳහා පීට් මඩ ඉවත් කිරීමේ නියැල සිටියෝය. මේ කම්කරුවන් අතර සිටි ඇන්ඩි මෝල්ඩ් අන් පුද්ගලයන්ට වඩා සුවිශේෂ අයෙකු විය. එංගලන්තයේම නිෂ්පාදිත බැකෝ යන්ත්‍රයෙන් කැපී එන සෑම පීට් මඩ බඳුනක් වෙතම ඔහුගේ තියුණු ඇස් වරින් වර යොමු විය. ට්‍රක් රථයට පටවන පීට් අතර තිබෙන සුන්බුන් හැකිතාක් අඩුකිරීම ඔහුගේ අභිලාෂය විය. වරක් බැකෝ යන්ත්‍රයේ බඳුනට පිරවූ පීට් මඩ ඉහළට එසවෙන්ම එහි පැටලී ආ ලී කැබැල්ලක් වැනි දෙයක් තමා අසලට වැටෙනු දුටු ඇන්ඩි ඉතා අලස කමින් යුතුව එය අහුලාගෙන මදක් දුරින් සිටි සිය සගයා වූ එඩී ස්ලැක් වෙත විසිකලේ ඔහු කෝප ගන්වනු සිතාය. ස්ලැක් වහා ඉවතට පැන්නේය. එහෙත් ඇනඩි විසින් තමා වෙත එවූ වස්තුව බිම පතිත වෙන්ම එහි දැවටී තිබූ පීට් මඩ අතරින් ස්ලැක් යමක් දැක විමතියට පත්විය. ඒ අනෙකක් නොව මිනිස් සිරුරකට අයත් එක් පාදයකි.

වහා චෙෂයර් ප්‍රාන්ත පොලීසිය කැඳවිණි. වැඩිදුර පර්යේෂණ සඳහා එම මිනිස් පාදය පීට් වගුරෙන් ඉවත් කෙරිණි. මේ අතර අදාළ බලධාරීන් විසින් චෙෂයර් ප්‍රාන්ත පුරා විද්‍යාඥ රික් ටර්නර්ට මෙම පුවත දන්වන ලදී. ටර්නර් ඉතා කඩිනමින් පැමිණ වගුරුබිමේ අදාළ ස්ථානය පරීක්ෂා කලේය. ටර්නර්ගේ අරමුණු වූයේ එම මිනිස් පාදය අයත් මිනිස් සිරුරේ ඉතිරි කොටස් තැන්පත් වී ඇති ආකාරය පිළිබඳව සොයා බැලීමයි.





පශ්වාත් මරණ පරීක්ෂණයෙන් ගත් මිමි අනුව සුපරීක්ෂාකාරීව නිර්මාණය කළ ලින්ඩෝ හි මිනිසාගේ ජීවමාන මුහුණ. (වමේ) ලින්ඩෝ හිදී ගොඩගත් මළ සිරුරේ මුහුණේ සමීප දසුනක් (දකුණේ)

දීර්ඝ පරීක්ෂාවකින් පසුව ටර්නර්ට සිය අරමුණ මුදුන්පත් කරගැනීමේ වාසනාව ලැබිණි. පීට් මඩ ඉවත් කිරීම නිසා බාහිර වායුගෝලයට විවෘත වීම හේතුවෙන් කළු පැහැ ගැන්වුණු හමක් සහිත මළ සිරුර දැක ගැනීමට නොබෝ වේලාවකින් හෙතෙම සමත් විය. මළ සිරුරේ හම සහ හිස් කබලේ කෙස් පවා හොඳින් ඉතිරිවී තිබිණි. සාමාන්‍යයෙන් මඩ සහිත පරිසරයක් තුළ නිර්වායු පරිසරයක් පවතින බව ටර්නර් සිය අත්දැකීමෙන් ප්‍රත්‍යක්ෂ කොට තිබිණි. මේ හේතුව නිසාම මඩෙහි ගිලීගිය මළ සිරුරු නවීන ඒවාද නැතහොත් පැරණි ඒවාද යන්න දැන ගැනීමේ අභියෝගයකට ඒවා හමුවන මොහොතේම මුහුණදීමට සිදුවන බව ටර්නර් දැන සිටියේය. නැවතත් පොලීසිය කැඳවුණු අතර අගෝස්තු 6 වන සඳුද එම මළ සිරුර ගොඩගැනීමේ කණ්ඩායමට විශේෂඥ පිරිසක් ඇතුළත් විය. ඒ අතර සංරක්ෂණ විශේෂඥයකු වූ වෙල්සන් ගොරි පුරා උද්භිද විද්‍යාඥයෙක් වූ ජිල් ස්ටින් හා නයිජල් රිචඩ්සන් සහ මානව ජීව විද්‍යාඥයෙක් වූ රොබට් කොනෙල් ද විය. පොළොවේ වැළලී සිටි සිරුරක් ඊට අයත් සියලුම දත්ත සුරැකෙන අයුරින් ගොඩගැනීමේ කාර්ය සඳහා වැදගත්වන මූල් කටයුත්ත එය නියමිත පරිදි පිරිසිදු කිරීම බව කණ්ඩායමට වැටහී ගොස් තිබිණි. මළ සිරුරේ දැවටී තිබූ පීට් මඩ ඉවත් කිරීමට කටයුතු සූදානම් කෙරිණි. මළ සිරුර යටින් තුනී ලෑලි තහඩුවක් යවා ඉතා සුරක්ෂිත ලෙස එම සිරුර ඉවතට ගත් අතර එය වහාම මැක්ලෙස්ෆීල්ඩ් දිස්ත්‍රික් සහා රෝහල් මෘත ශරීරාගාරය වෙත යැවිණි.

මළ සිරුර ගොඩගත් කණ්ඩායමේ අදහස වූයේ මෙම සිරුර අයත් කාල වකවානුව නිශ්චිතව ස්ථිර කරන තුරු එය මෘතශරීරාගාරයේ තැන්පත් කොට තැබිය යුතු බවය.

කාබනික ද්‍රව්‍යය සුලබ වූ මෙවැනි අවශේෂයන් කෙතරම් පැරණිද යන්න සොයා ගැනීම සඳහා ඉවහල් වන ක්‍රමයක් විලාර්ඩ් ලිබ් නම් රසායන විද්‍යාඥයකු 1940 දශකයේදී ලොවට හඳුන්වා දී තිබිණි. මෙම ක්‍රමය හැඳින්වෙන්නේ විකිරණශීලි කාබන් 14 ක්‍රමය යනුවෙනි. මළ සිරුර සම්බන්ධ ව්‍යාපෘතිය භාරව කටයුතු කළ කණ්ඩායම් විසින් මෙම ක්‍රමය භාවිත කොට මළ සිරුර කොපමණ පැරණිද යන්න තීරණය කිරීම සඳහා වහා කටයුතු

**රාජ් සෝමදේව**

**මළ සිරුරේ දැවටී තිබූ පීට් මඩ ඉවත් කිරීමට කටයුතු සූදානම් කෙරිණි. මළ සිරුර යටින් තුනී ලෑලි තහඩුවක් යවා ඉතා සුරක්ෂිත ලෙස එම සිරුර ඉවතට ගත් අතර එය වහාම මැක්ලෙස්ෆීල්ඩ් දිස්ත්‍රික් සභා රෝහල් මෘත ශරීරාගාරය වෙත යැවිණි.**



ලින්ඩෝහි දී මළ සිරුර ගොඩගැනීම සඳහා පර්යේෂකයන් පිරිස යුහුසළු වන අන්දම.

සම්පාදනය කළේය. විකිරණශීලී කාබන් දින නිර්ණයක් ලබා ගැනීම සඳහා අවශ්‍ය කරන කාබනික ද්‍රව්‍ය අවශ්‍ය තරම් ලින්ඩෝව් මළ සිරුරේ සහ එහි තැවරී තිබුණ පීට් මඩ–වල අන්තර්ගතව තිබීම ඒ වන විටත් කාගේත් බලාපොරොත්තු දල්වන්නක් වී තිබිණි. මේ සඳහා මුල්වරට කැඳවන ලද්දේ බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ විද්‍යාගාරයයි. එහෙත් එය සාර්ථක ප්‍රවේශයක් නොවූයේ එම විද්‍යාගාරය එවැනි දින නිර්ණයක් සඳහා විශාල ප්‍රමාණයේ තියැදි භාවිත කරන උපක්‍රම පම–ණක් අනුගමනය කිරීම නිසාය. ලින්ඩෝව් මළ සිරුරෙන් එවැනි තියැදි ලබාගැනීමෙන් එයට බර–පතල හානියක් වන බව ද කණ්–ඩායමට වැටහිණි.

හොඳම විකල්පය වූයේ වෙනත් විද්‍යාගාරයක සහය පැතීමයි. ඒ අනුව ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ විකිරණ විද්‍යාගාරය ඇමතිණි. ඔවුහු ඉතා කුඩා තියැදි භාවිත කිරීමෙන් දින වකවානු ලබාගන්නා ක්‍රමයක් අනුගමනය කරති. අවාසනාවකට මෙන් ඒ වන විටත් ඔක්ස්ෆර්ඩ් විද්‍යාගාරයේ සේවක පිරිස සිය වාර්ෂික නිවාඩු වාරය ලබාගෙන තිබුනෙන් විද්‍යාගාරය වසා තිබිණ. මේ අතර මැක්ලේස්ෆීල්ඩ් රෝහලේ කොරනෙල්වරයා පර්යේෂණ කණ්ඩායම වෙත දන්වා සිටියේ මළ සිරුර කුමන කාලයකට අයත් දැයි නිශ්චිතව තමා වෙත වාර්තා කරන තුරු එය කිසිදු කටයුත්තක් සඳහා මුදවා හැරිය නොහැකි බවය. මෙය කිසියම් අභිරහසකට සම්–බන්ධ සාධකයක් නම් එය තමන්ගේ රාජකාරිය වෙත සෘජුවම බලපාන්නක් බව හෙතෙම දැන සිටියේය.

දින නිර්ණ සඳහා කළ හැකි අන් දෙයක් නොවූයෙන් හාවෙල් හි පර–මාණු බලශක්ති පර්යේෂ–ණාගාරයේ රොබර්ට් ඔට්ලෙට් ඇමතීමට පර්යේෂණ කණ්ඩායම තීරණය කළහ. ඒ වැයම සාර්ථක විය. ලින්ඩෝව් මළ සිරුරේ එක් අතකට අයත් ඇටයකින් ග්‍රෑම් 6.5 ක තියැදියක් ලබා ගත් අතර එය පොලිස් ආරක්ෂාව යටතේ හාවෙල් රසායනාගාරය වෙත ප්‍රවාහනය කෙරිණි.

මළ සිරුර ගොඩගැනීමෙන් දින දහතුනකට පසු එනම් අගෝස්තු 17 වන ද එම සිරුර වසර 1000 කට වඩා පැරණි බව රොබට්–ඔට්ලෙට් විසින් නිවේදනය කරන ලදී. එදිනම මැක්ලෙස්ෆීල්ඩ් රෝහලේ කොරනෙල්වරයා විසින් සිරුර මුදාහරින ලද අතර අන–තුරුව එය ලන්ඩනයේ පිහිටි බ්‍රිතාන්‍යයේ කෞතුකාගාරය වෙත වැඩිදුර පර්යේෂණ සඳහා ගෙන–යන ලදී.

බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේදී ලින්ඩෝ මළ සිරුරේ කොටස් හා එය තැනපත්ව තිබූ පීට් වගුරේ මඩ තියැදි ක්‍රමවත් ලෙස එකතු කොට ඔක්ස්ෆර්ඩ් විද්‍යාගාරයත් හාවෙල් පරමාණු බලශක්ති පර්–යේෂණ මධ්‍යස්ථානයත් බ්‍රිතාන්‍ය කෞතුකාගාරයත් හවුලේ, නැවත දින නිර්ණ පරීක්ෂාවක් සිදුකරන ලදී. එහි ප්‍රතිඵල මගින් පෙන්වා දෙන ලද්දේ ලින්ඩෝව් මළ සිරුර ක්‍රිස්තු පූර්ව 300 ට අයත් වන බවයි. එනම් එම සිරුර මින් වසර දෙදහස් දෙසියකට ඉහත මියගිය පුද්ගලයෙකුට අයත් වූ බවය. මැක්ලෙස්ෆීල් රෝහලේ මෘතශ–රීරාගාරයෙන් ඉවත් කළ මොහොතේ සිට මළ සිරුර තැන්–පත් කොට තබන ලද්දේ සෙල්–සියස් අංශක 4 ක උෂ්ණත්වයකින් යුත් පරිසරයක් තුළය. එසේ වුවද වැඩිදුර පර්යේෂණ සඳහා මළ සිරුර ලක් කිරීමට ප්‍රථම ගොඩ–නැගීමෙන් පසුව කිසියම් නරක්වී–මක් නොවීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට මුල සිටම සියල්ලෝම වගබලා ගත්හ. බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේදී මෙම සිරුර සම්බන්ධයෙන් වැඩිදුර පර්යේෂණ කිරීමේ කටයුත්ත භාරවූයේ ලන්–ඩන් විශ්ව විද්‍යාල රෝහලේ ශල්‍ය ක්ෂුද්‍ර ජීව විද්‍යා අංශයේ වෛද්‍ය පී.එල්. රිජ්වේ සහ ඔහුගේ කණ්–ඩායමටය.

සිය පර්යේෂණ කටයුතුවලට එළඹීමට මත්තෙන් සිරුරේ කුමන හෝ කුඩා කොටසක් නරක් වීම ආරම්භ වී ඇත්දැයි සෙවීම රිජ්–වේගේ අරමුණ විය. යම් හෙයකින් ඇසට ගොදුරු නොවී එවැන්නක් මේ වන විටත් ඇරඹී තිබේ නම් එය වහා පාලනය කිරීමේ අව–ශ්‍යතාව ඔහුට මැනවින් වැටහී තිබිණ.

ඒ සඳහා මාස හයක කාලයක් ගත කළ වෛද්‍ය රිජ්වේ එම කාලය තුළ සිරුර සම්බන්ධයෙන් එකිනෙ–කට වෙනස් පරීක්ෂාවන් එකො–ළහක් පවත්වා තිබිණ. ඒවායේ ප්‍රතිඵල අනුව මළ සිරුර මත හෝ අභ්‍යන්තරයේ කිසිදු නරක්වීමක් ආරම්භ වී නොතිබූ බව රිජ්වේ විසින් ස්ථිර කරන ලදී.

රිජ්වේගේ පර්යේෂණවලින් අනතුරුව අස්ථි පිළිබඳ ශෛල්‍ය වෛද්‍යවරයෙකු වූ ඉයන් වෙස්ට් විසින් ලින්ඩෝව් මළ සිරුර සම්–බන්ධයෙන් පශ්චාත් මරණ පරීක්–ෂණය ආරම්භ කෙරිණි. ඔහුගේ ප්‍රධාන අරමුණ වූයේ එම මරණ–යට හේතුව සොයා ගැනීමයි. එහිදී ඔහුගේ අවධානය යොමුවූයේ සිරුරේ මතුපිට කිසියම් අනතුරක සේයාවක් තිබේදැයි සොයාගැ–නීමටය. මෙහිදී වෛද්‍ය ඉයන් වෙස්ට් හට මුහුණ දීමට සිදුවූ ප්‍රධාන අභියෝගය වූයේ මළ සිරුර ගොඩගත් අවස්ථාවේ සිට ඒ දක්වා කාලය තුළ ප්‍රවාහනය හා වෙනත් හේතු නිසා සිරුරේ මතුපිටට සිදු–විය හැකි සියුම් වෙනස්කම් මග–හැර, නියමානුකූලව එය ලින්ඩෝව් වගුරේ ගිලෙන්නට ප්‍රථම ඇතිවූ තුවාල තිබේ නම් ඒවා හඳුනා–ගැනීමය.

මෙවැනි හඳුනාගැනීමක් සඳහා වෛද්‍ය වෙස්ට් සෙරෝ රේඩියෝග්‍රැෆි (Xeroradiography) ක්‍රමයේ සහය ලබා ගත්තේය. මළ සිරුරේ උරකුහරය සම්බන්ධයෙන් ලබාගත් එවැනි සටහනකින් එම සිරුරේ දකුණු පස උරහිස අස්ථිය අසාමාන්‍ය ලෙස කැඩී ඇති ආකාරය හෙතෙම නිරීක්ෂණය කළේය. බිඳුණු කැබලි දෙක අතර සෙන්ටිමීටර් 3ක පරතරයක් තිබෙන බැවින් එය ස්වාභාවික බිඳීමකට වඩා කිසියම් මොට්ට උපකරණයකින් පහර දීමකින් සිදුවූදෙයක් විය හැකියයි ඔවුහු අනුමාන කළහ. මේ සැකය තවදුරටත් ස්ථිර කරන සාධකයක් මළ සිරුරේ ඉළ ඇටවලට යටින් එහි මැද නාරටියේ වූ තවත් පටු සිදුරක් ඔහුට නිරීක්ෂණය කළ හැකිවිය. හිස්කබල පරීක්ෂා කිරීම සඳහා එහි අධෝරක්ත ඡායාරූපයක් ලබා ගැනීමට වෙස්ට් තීරණට කළේය. එය සාර්ථක වැයමක් විය. ලින්ඩෝව් මළ සිරුරේ හිස මුදුනේ වූ පැල්ම ඡායාරූපයේ ඉතා පැහැදිලිව දිස්විය.



විද්‍යාගාරයේදී පර්යේෂණයට ලක්කෙරෙන ලින්ඩෝහි මිනිසා

**බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේදී ලින්ඩෝව් මළ සිරුරේ කොටස් හා එය තැනපත්ව තිබූ පීට් වගුරේ මඩ නියැදි ක්‍රමවත් ලෙස එකතු කොට ඔක්ස්ෆර්ඩ් විද්‍යාගාරයත් හාවෙල් පරමාණු බලශක්ති පර්යේෂණ මධ්‍යස්ථානයත් බ්‍රිතාන්‍ය කෞතුකාගාරයත් හවුලේ, නැවත දින නිර්ණ පරීක්ෂාවක් සිදුකරන ලදී. එහි ප්‍රතිඵල මගින් පෙන්වා දෙන ලද්දේ ලින්ඩෝව් මළ සිරුර ක්‍රිස්තු පූර්ව 300 ට අයත් වන බවයි.**

අනතුරුව එම පැල්මේ සමීප ඡායාරූපයක් ලබා ගැනිණි. මළ සිරුරේ හිස ඉතා අසාමාන්‍ය ලෙස පහතට නැමී ඉතා අපහසු ආකාරයෙන් පපුවේ එක් පසකට ඇලවී තිබිණි. මෙකී අසාමාන්‍ය ආකෘතිය පිළිබඳ ඉතා දැඩි සැකයක් පහළ කළ වෙස්ට් සිරුරේ හිස හා බෙල්ල පෙදෙසේ පරිගණක ටොමෝග්‍රැෆික ස්කෑනර් ප්‍රතිරූපයක් ලබා ගැනීමට කටයුතු කළේය. එහිදී ඔහුගේ අභිප්‍රාය වූයේ කොඳුඇට පෙළේ මුල් කොටසේ කිසියම් බිඳීමක් ඇති වී තිබේ දැයි නිශ්චිතව දැන ගැනීමය. යම් හෙයකින් එසේ බිඳීමක් නිරීක්ෂණය කළ හැකි වුවහොත් මළ සිරුරේ හිසෙහි දැනට දක්නට තිබෙන අසාමාන්‍ය නැම්ම හිස පිටුපසට තදින් පහර දීමකින් සිදුවිය හැක්කක් වීමට ඉඩ ඇති බවට වෙස්ට් පූර්ව විනිශ්චයකට ඒ වන විටත් එළඹ සිටියේය. ස්කෑනර් ප්‍රතිරූපයේ දැක්වෙන අන්දමට මළ සිරුරේ කොඳු ඇට පේළියේ ඉහළ ඇට බිඳී තිබිණ. මේ පරීක්ෂාවට මළ සිරුර සූදානම් කිරීමේදී තවත් අපූරු දෙයක් පර්යේෂකයන්ට නිරීක්ෂණය කළ හැකි විය. ඒ මළ සිරුරේ ගෙල වටා වූ කුඩා ලණුවකි. එය මිලිමීටර් 1.5 ක ඝනකමකින් යුත් ගසක පට්ටා විශේෂයකින් සකස් කරන ලද්දක් බවට හඳුනා ගැනිණ. එය නිරීක්ෂණය කරන අවස්ථාවේද එම ලණුව හමට කාවැදී තද වී තිබිණි. එය ආභරණයක් විය හැකි යැයි මුලින් තිබූ අනුමානය වෙනස් වූයේ ලණුව බෙල්ල වටා තදවී එය බෙල්ලේ වට ප්‍රමාණයට වඩා මදක් කුඩාවට තිබීම නිසාය.

එකී ලණුවේ ගැටයේ ස්වභාවය අධ්‍යයනය කිරීම සඳහා අස්ථි විද්‍යාඥයෙක් මෙන්ම ගැට පිළිබඳ විශේෂඥයෙක් වූ ජේෆ්රි බඩ්වත් කැඳවිණි. සියුම් පරීක්ෂාවකින් අනතුරුව ඔහුගේ නිගමනය වූයේ එය ගෙල සිර කිරීම සඳහා යෙදවූ ගැටයක් බවය. මේ සියල්ලම නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව නියත වශයෙන්ම ලින්ඩෝව් හි මළ සිරුර අයත් මිනිසා කිසියම් හදිසි අනතුරකින් මියගිය පුද්ගලයෙකු බවට යම් ස්ථිරතාවක් පර්යේෂණ කණ්ඩායමට ඇතිවිය. හිසේ හා කොඳු ඇට පෙළේ තුවාල පිටුපසින් පැමිණ තදින් පහර දීමකින් සිදුවූවක් බවද ඉදිරිපස ඉළ ඇට ප්‍රදේශයේ සිදු වී තිබූ තුවාල එම පහර නිසා ක්ෂණිකව බිම ඇදවැටීමෙන් සිදුවූවක් බවද පර්යේෂණ කණ්ඩායමේ නිගමනය විය. පහර දීමෙන් බිම ඇද වැටුණු පසු ගෙල සිර කිරීමෙන් ඔහුගේ මරණය සිදුවන්නට ඇති බවත් ගෙල සිර කිරීම කිසියම් යාග ක්‍රමයක අංගයක් වන්නට ඇති බවත් පර්යේෂණ කණ්ඩායමේ නායක වෛද්‍ය වෙස්ට් විසින් නිවේදනය කළේය.

ලින්ඩෝව් මළ සිරුර හමුවීමෙන් අනතුරුව එවැනි පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති සොයා ගැනීමකින් කුමන අන්දමේ තොරතුරු ලබාදීමට නූතන විද්‍යාත්මක ක්‍රම සමත් විනිදැයි මැනවින් හෙළිවිය. එම සිරුර පිළිබඳ පර්යේෂණ අවධානය අංශ කීපයක් ඔස්සේ විහිදී තිබිණ. ඒ අතරින් වඩාත් පුළුල් අවධානයක් යොමු කිරීම සඳහා අවකාශයක් ලැබී තිබුණේ රෝග තත්ත්ව හඳුනා ගැනීම සහ ආහාර රටාව තේරුම් ගැනීම කෙරෙහිය.

වසර දෙදහස් තුන්සියයකට පමණ පෙර බේදවාචකයකින් මියගිය ලින්ඩෝව් මිනිසා සිය ජීවමාන සමයේදී කුමන අන්දමේ සෞඛ්‍ය තත්ත්වයකින් පසු වූයේද යන්න තේරුම් ගැනීම සඳහා ඒ පිළිබඳ වැඩිදුර පර්යේෂණ පැවැත්වූවන්ගේ කුතුහලාත්මක අවධානය යොමුවී තිබිණි. මේ



ආශ්‍රැත ජලය ඉසිමින් මළ සිරුර පිරිසිදු කරන අයුරු



විද්‍යාගාරයේදී පර්යේෂණයට ලක්කෙරෙමින්

සම්බන්ධයෙන් වඩාත් හොඳ ප්‍රතිඵල ලබාදෙන ලද්දේ ඔහුගේ අන්ත්‍රවල අඩංගුව තිබූ ද්‍රව විශ්ලේෂණය කිරීමෙනි. එහිදී පණුවන් දෙවර්ගයකට අයත් බිත්තර මේ පිළිබඳව පර්යේෂණ මෙහෙයවූ පරපෝෂිත විද්‍යාඥ ඇන්ඩෘ ජෝන්ස්ට සිය අන්වීක්ෂයෙන් නිරීක්ෂණය කළ හැකි විය. ඉන් එක් බිත්තර කොටසක් ට්‍රිචුරිස් ට්‍රිචිව්‍රා (Trichuris trichiura) නම් පණු විශේෂයකට අයත් වූ ඒවාය. මෙකී පණු වර්ගය ශරීරය ජීවත්වීම හේතුකොටගෙන බඩගින්න අඩුකම, උදාසීනත්වය, පාචනය, ඇනීමියාව බර අඩුවීම හා අන්ත්‍රවල අභ්‍යන්තර ලේගැලීම් යන රෝග තත්ත්ව ඇතිවන බව ජෝන්ස් විසින් පෙන්වා දෙන ලදී. ලින්ඩෝව් මිනිසාගේ අන්ත්‍රවලින් හඳුනාගනු ලැබූ අනෙක් පණු වර්ගය වූයේ අකාරිස් ලුම්බ්‍රිකොයිඩේස් (Acaris lumbricoides) නමින් හැඳින්වෙන විශේෂයයි. මේ පණුවා මනුෂ්‍ය ශරීරයට සංක්‍රමණය වන්නේ ගෘහාශ්‍රිත වූ ඌරාගෙනි. ට්‍රිචූරිස් පණුවාට වඩා හානියක් අකාරිස් වර්ගයේ පණුවාගෙන් මිනිස් සිරුරට අත්විය හැකිය. කුඩා අන්ත්‍රයේ ජීවත් වන මෙම පණුවා දිනකට බිත්තර ලක්ෂ දෙකක් පමණ දමයි. පණුවාගේ ක්‍රියාකාරීත්වය නිසා පෙනහළු ආබාධ පවා ඇතිවන බව ජෝන්ස් විසින් පෙන්වා දීමත් සමගම ලින්ඩොව් මිනිසා සිය ජීවිතයේ අවසාන කාලය තුළ පීඩා විඳි රෝග තත්ත්ව පිළිබඳ කිසියම් අවබෝධයක් ලබා ගැනීමට පරීක්ෂණ කණ්ඩායමට හැකිවිය. මළ සිරුරේ අන්ත්‍රවලින් ලබාගත් ආහාර කොටස් ග්‍රෑම් 20 ක් ටිම් හෝල්ඩන් සහ ගෝර්ඩන් හිල්මන් වෙත යැවිණි. කිසිවෙකු විසින් සිය මුඛයේදී හොඳින් සපා ගිලින ලද ආහාර පිඩක ඇතිදේ විශ්ලේෂණය කිරීම තරමක් අපහසු කටයුත්තක් වුවත් අන්වීක්ෂීය නිරීක්ෂණ ඉවහල් කොටගෙන ධාන්‍ය වර්ග කිහිපයක් පිළිබඳ සාධක හඳුනා ගැනීමට පර්යේෂකයෝ සමත් වූහ. ඒ අතර තිරිඟු රයි, බාර්ලි, ඕට්ස් යන ධාන්‍ය වර්ගවලට අයත් ඇට කොටස් නිරීක්ෂණය කළ හැකිවිය. මෙම ධාන්‍යවල ඉතා කුඩා කොටස් අනුව ලින්ඩෝව් මිනිසා අවසන් වරට එම ධාන්‍ය මිශ්‍රකොට සාදන ලද පාන් වර්ගයක් අනුභව කරන්නට ඇතැයි යන අනුමානය ඉදිරිපත් විය.

ලින්ඩෝව් හි මිනිසාගේ මඩෙහි ගිලුණ මළ සිරුර සොයාගැනීමෙන් අනාවරණය වූයේ වසර 2, 300 කට පෙර මියගිය පුද්ගලයෙකුගේ බේදවාචකය පමණක් නොවේ. ඔහුගේ ස්වරූපය හා ඔහු සම්බන්ධ තවත් බොහෝ දෑ ඒ අතර විය. එපමණක් නොව එවැනි ආරක්ෂිත මළ සිරුරක් කොපමණ පැරණි වුවද ඉන් වර්තමානයට ලබාගත හැකි දැනුමේ ස්වභාවය පිළිබඳ ප්‍රායෝගික පෙරහුරුවක්ද එමගින් හෙළි දරව් කෙරිණි.

**ඡායාරූප උපුටා ගැනීම**
**දෙන් බ්‍රොක්වෙල් ගේ 1986**
**The bog man and the**
**Archaeology of people**
**නම් කෘතියෙනි.**